SC



# ජනකවියෙන් පිළිබිඹු වන වන්නි හත්පත්තුවේ ජනජීවිතය

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
07 MAR 2011
UNIVERSITY OF KELANIYA

දර්ශනපති උපාධිය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ
සිංහල අධ්‍යයනාංශය වෙත ඉදිරිපත් කරනු ලබන
පර්යේෂණ නිබන්ධය යි
2003 අප්‍රේල්

එම්.ඒ.බී.ආර්.බී. ආලෝකබණ්ඩාර
(B.A.,Dip.Ed,M.A.)
AFG/04/02/08/2001/9



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 603 |
| වර්ග අංකය | |



සිංහල අධ්‍යයනාංශය - කැලණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

## සාරසංග්‍රහය

**වන්නි** යන යෙදුමෙහි මුල් අරුත වනගත පෙදෙස යන්න යි. එය අප වහරෙහි මූලික වශයෙන් අරුත් දෙකක යෙදේ. එහි මුල් අරුත **වනගත පෙදෙස** යන්න යි. දෙවැන්න **වර්ණනීය** යන්න යි. අප ඉතිහාසය විමසා බලන විට **වන්නි** යන වදන ඊටත් වඩා පුළුල් අර්ථයකින් යෙදෙන බව දැක්විය හැකි ය. වන්නිවරුන් හෙවත් **වන්නිනායකවරුන්** ද **වන්නි** ප්‍රදේශ ගැන ද කෙරෙන විචිත්‍ර ඓතිහාසික වර්ණනා බොහෝ ය. මීට අමතරව වෙනත් වන්නි නායකයින් පිරිසක් ගැන ද ඉතිහාසයෙහි සඳහන් වේ. ඔවුන් පිළිබඳව දඹදෙණි යුගයේ මුල් කාලයේ රචිත කෘතින් රැසක තොරතුරු ඇතලත් වේ. පොළොන්නරු යුගයේ පැවති රාජ්‍ය වියවුල් හේතු කොට ගෙන ඇතැම් සිංහල කුමාරවරුන් වනගත පෙදෙස් කරා පලාගිය බව මේ කෘතීන්හි කියැවේ. මේ කුමාරවරුන් වරින්වර එකී ප්‍රදේශවල ප්‍රදේශාධිපතීන්ව සිටි බැව් පෙනීයන අතර ඒ ප්‍රදේශ හැඳින්වෙන්නේ **වන්නි ප්‍රදේශ** යන නමින් ය. එකී කුමාරවරුන් හැඳින්වෙනුයේ ද **වන්නිවරුන්** හෙවත් **වන්නිනායකයින්** වශයෙනි. ඒ අනුව අප ඉතිහාසයේ **වන්නිවරුන්** කොටස් දෙකක් වූ බැව් නිගමනය කිරීමට සිදු වේ. මේ මුල් පිරිස ද්‍රවිඩ ප්‍රභවයක් සහිතව රටේ උතුරු මායිමෙහි බලවත්ව සිටි අධිපතීන් ය. දෙවැනි පිරිස ඇතැම් විට රටේ උතුරුමැද හා වයඹදිග වනගත පෙදෙස්හි බලයට පැමිණි සිංහල කුමාරවරුන් ය.

යාපහු රාජධානිය කේන්ද්‍ර කොට ගනිමින් කුරුණෑගල, දඹදෙණිය හා පඬුවස්නුවර යන සත්කෝරලයේ ඉපැරණි සිංහල රාජධානි තුනක් අතර ව්‍යාප්ත වූ වන්නි හත්පත්තුව නිතැතින් ම පැරණි සිංහල රජවරුන්ගේ අනුග්‍රහයට පාත්‍ර වූ ප්‍රදේශයක් විය. මෙරට වාරිකර්මාන්ත විෂයෙහි මහත් සේවයක් ඉටු කළ මහසෙන්, මහපැරකුම්බා වැනි අතීත හෙළ රජවරුන් ගංගා, ඇළදොල සම්බන්ධ කර ගනිමින් ගොඩනැංවූ මහා වාරිකර්මාන්ත වලිනුත්, රාෂ්ට්‍ර පාලන ක්‍රියාදාමයේ දී දේශපාලනික වශයෙන් ඉතිහාසයේ පෙළගැසෙන යම්-යම් සංසිද්ධීන් වටා බැඳුණු ඓතිහාසික ස්ථාන රැසකිනුත් මෙහි භූමිය සමන්විත වේ.

කෘෂිකර්මාන්තය ජීවනෝපාය කර ගත් මෙහි වැසියෝ බෞද්ධ දිවිපෙවෙතකට හුරු වූවෝ ය. ඉතිහාසයේ දිගින්දිගට ම ආ තත්කාලීන කටුක අත්දැකීම් හමුවේ ඔවුහු තම සංස්කෘතික අනන්‍යතාව පරිවර්තනයන් කරා යා නොදී සම්ප්‍රදායිකව ආරක්ෂා කළෝ ය. කෘෂිකර්මාන්තය කේන්ද්‍ර කර ගනිමින් දීර්ඝ කාලයක් පුරා ගොඩනගාගත් මේ සංස්කෘතිය

ඉක්මනින් වෙනසකට පාත්‍ර වන බවක් පෙනෙන්නට නැත. මෙවැනි වෙනසක් විෂයෙහි පැරැන්නන් දක්වන්නේ ද බලවත් අකමැත්තකි. අවුරුද්දේ වැඩි කාලයක් නියඟ වැනි ස්වාභාවික උවදුරුවලින් පීඩාවට පත් වන මෙහි වැසියන්ගෙන් බොහෝ දෙනා දරිද්‍රතාවෙන් පෙළෙන්නෝ ය. ජීවත්වීම පමණක් අරමුණු කොට ගත් ඔවුන් නිවාස, අධ්‍යාපනය හාසෞඛ්‍යය වැනි මූලික මිනිස් අවශ්‍යතා කෙරෙහි දක්වන්නේ අඩු සැලකිල්ලකි. දෘශ්‍යමාන බලවේගයන්ගෙන් පිහිටක් නොලැබෙන තැන ඔවුන් නොපෙනෙන බලවේගයන් කරා ඇදී යාම නොවළැක්විය හැකි ය. දිවයිනේ අනෙකුත් ප්‍රදේශයන් හා සසඳා බලන කල මොවුන්ගේ භෞතික හා අභෞතික සංස්කෘතිකාංගයන්හි යම් යම් වෙනස්කම් ද පෙනෙයි. ඒ වෙනස්කම් මත ඔවුන්ගේ ප්‍රාදේශීය අනන්‍යතාව රඳා පවතින අතර ඔවුන්ගේ සංස්කෘතික ජීවිතය අධ්‍යයනයට මෙය නිසි ප්‍රස්තුතයක් වන්නේ ද එහෙයින් ම ය.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.